# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1981 අංක 42 දරන බෞද්ධ විහාර දේවාලගම් (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1981 ජූලි මස 2 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1981 ජූලි මස 3 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැක

මිළ : ශත 35 යි — තැපැල් ගාස්තුව : ශත 50 යි

# 1981 අංක 42 දරන බෞද්ධ විහාර දේවාලගම් (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1981 ජූලි මස 2 වන දින]

එල්. ඩී.—ඕ. 9/80

**බෞද්ධ විහාර දේවාලගම් ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

**ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වන දිනය.**

1. මේ පනත 1981 අංක 42 දරන බෞද්ධ විහාර දේවාලගම් (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර, ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයකින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන දිනයක එය ක්‍රියාත්මක විය යුතු ය.

**318 වන අධිකාරය සංශෝධනය කිරීම.**

2. (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) බෞද්ධ විහාර දේවාලගම් ආඥාපනත,—

(අ) ප්‍රධාන ප්‍රඥප්තියේ 2 වන, 9 වන, 15(4) වන, 46 වන සහ 48 වන වගන්තිවල හැර, එහි කවර හෝ තැනක සඳහන් වන "මහා භාරකාරවරයා" යන යෙදුම වෙනුවට, "බෞද්ධ කටයුතු පිළිබඳ කොමසාරිස්වරයා" යන යෙදුම ; සහ

(ආ) ප්‍රධාන ප්‍රඥප්තියේ 2 වන වගන්තියේ හැර, එහි කවර හෝ තැනක සඳහන් වන "රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා" යන යෙදුම වෙනුවට, "බෞද්ධ කටයුතු පිළිබඳ කොමසාරිස් වරයා" යන යෙදුම

ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**ප්‍රධාන ප්‍රඥප්තියේ 2 වන වගන්තිය සංශෝධනය කිරීම.**

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 2 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(අ) "භික්ෂූන් වහන්සේ" යන අර්ථකථනයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් අර්ථකථනය ඇතුළත් කිරීමෙන් :—

'"බෞද්ධ කටයුතු පිළිබඳ කොමසාරිස්වරයා" යන්නෙන් බෞද්ධ කටයුතු පිළිබඳ කොමසාරිස් ධුරය තත් කාලයේ දරන තැනැත්තා අදහස් වන අතර, යම් නියෝජ්‍ය කොමසාරිස්වරයෙක් ද ඊට ඇතුළත් වේ ;'; තවද

(ආ) "රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා" යන අර්ථකථනය අත්හැරීමෙන්.

**ප්‍රධාන ප්‍රඥප්තියේ 15 වන වගන්තිය සංශෝධනය කිරීම.**

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 15 වන වගන්තියේ (4) වන උපවගන්තිය ඉවත් කොට, ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

"(4) මේ ආඥාපනත ක්‍රියාත්මකවීම ආරම්භ වීමට පෙර හෝ පසුව, යම් විහාරාධිපතීන් වහන්සේ නමක් හෝ භාරකරුවකු විසින් හෝ කරන ලදැයි කියන සෑම දුෂ්කෘතයක්, විශ්වාස කඩකිරීමක් හෝ කාර්ය නොසලකා හැරීමක් සම්බන්ධයෙන් ම

මේ වගන්තිය යටතේ ක්‍රියා මාර්ග ආරම්භ කළ හැකි අතර, කලින් කල සංශෝධිත, මහා භාරකාර ආඥාපනතින් භාරය පිළිබඳ තත්ත්වය සහ ගිණුම් විමර්ශනය කිරීම සඳහා මහා භාරකාරවරයාට පවරා ඇති සියලු බලතල එකී ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් බෞද්ධ කටයුතු පිළිබඳ කොමසාරිස්වරයාට තිබිය යුතු ය.".

අයිතිවාසිකම්, වගකීම් සහ බැදීම් පැවරීම.

5. (1) මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භවීමේ දිනයට පෙරාතුව ම, ප්‍රධාන ප්‍රඥප්තිය යටතේ මහා භාරකාරවරයාගේ සහ රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාගේ සියලුම අයිතිවාසිකම්, වගකීම් සහ බැදීම් බෞද්ධ කටයුතු පිළිබඳ කොමසාරිස්වරයාගේ අයිතිවාසිකම්, වගකීම් සහ බැදීම් ලෙස සලකනු ලැබිය යුතු ය.

(2) මහා භාරකාරවරයා විසින් හෝ රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා විසින් හෝ ප්‍රධාන ප්‍රඥප්තිය යටතේ ආරම්භ කරනු ලැබ, මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වීමට පෙර අවසාන නොවූ යම් ක්‍රියාවක් හෝ ක්‍රියා මාර්ගයක්, බෞද්ධ කටයුතු පිළිබඳ කොමසාරිස්වරයා විසින් කරගෙන යාම හා අවසාන කිරීම කළ හැකි ය.

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත් වල සහ නීතිවල වාර්ෂික දායක මිල (දේශීය) රු. 30 කි. (විදේශීය) රු. 40 කි. කොළඹ 1, තැ. පෙ. 500, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.